කොවිඩ්-19 වාර්තාකරණයේදී ඇතැම් මාධ්‍ය විසින් ආසාදිතයින්ව සමාජ ගර්හාවකට ලක් විය හැකි ආකාරයෙන්, සමාජයේ කොන් කිරීමකට ලක් විය හැකි ආකාරයෙන් හැඳින්වීම වරදක් නොවේද යන්න අපි දිගින් දිගටම කතිකාවට ලක් කොට ඇත්තෙමු. කෙසේ වෙතත්, තවමත් එවැනි නාමකරණයන් පුවත් වාර්තාවන් තුළ දක්නට ලැබේ.

ලංකාදීප පුවත්පතේ (11/09) සහ දිවයින පුවත්පතේ (11/09) දැක්වෙන "කොවිඩ් දරුවන්" සහ "කොවිඩ් යාචකයන්" යන යෙදුම් ඊට උදාහරණ වේ.

සිරස්තලයක් යෙදීමේදී අවම වචන ප්‍රමාණයකින් අදහසක් හෝ පණිවුඩයක් පරමාර්ථය සඳහා වුවත්, මෙවැනි භාෂා භාවිතයකට එය නිදහසට කරුණක් වන්නේද? කොවිඩ්-19 ආසාදිතයන් හැඳින්වීමට භාවිතා කෙරෙන මෙවන් යෙදුම් කෙතරම් ආචාර ධාර්මික සහ ශිෂ්ට සම්පන්න වන්නේද? මෙවැනි යෙදුම් ජනගත කිරීම ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයින් කෙරෙහි සමාජ කොන් කිරීමක් නිර්මාණය නොවන්නේද? එසේ නම් එය වගකීම් විරහිත මාධ්‍යකරණයම නොවන්නේද?

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Lankadeepa #Divaina**